SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
# வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
# Zonal Education Office - Colombo

දෙවන වාර පරීක්ෂණය - 2025

இரண்டாம் தவணைப் பரீட்சை - 2025

Second Term Test - 2025

**සිංහල භාෂාව හා සාහිත්‍යය I** **10 ශ්‍රේණිය** **කාලය පැය එකයි**

නම.............................................................

I. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. "දරුවා ළිඳ ළඟට ම දුවනු දුටු මවගේ <u>ඇඟේ ලේ වතුර වුණා</u>" යි එතැන සිටි අය පැවසූහ.
   1) ලේ වර්ගය වතුර වීම  2) ඉවසීමක් නැති වීම
   3) හොඳට ම බිය වීම  4) අධික කෝපයට පත් වීම

2. <u>තොරතෝංචියක් නැති ව</u> කියවන නාමලී දෙස අම්මා බලා සිටියා ය.
   1) නොනවත්වා ම  2) අවසරයක් නැති ව
   3) විටින් විට  4) විශාල ශබ්දයකින්

3. තම ධනය <u>අත දිගහැර වියදම් කිරීම නිසා</u> පසුකාලීන ව නිමල් දුගියෙක් විය.
   1) අතේ ඇති සියල්ල  2) අරපරිස්සමින්
   3) අනවසරයෙන්  4) ලෝභ නැතිව

- අංක 4 සිට 7 දක්වා ඇති ප්‍රශ්නවල හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. සංඝාවාසයකට සාමාන්‍යයෙන් ................................ වුණේ 'ආරාම' යන නාමය යි.
   1) අවබෝධ  2) ව්‍යවහාර  3) නිර්මාණය  4) නිර්මිත

5. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා ධනවතුන්ගේ ප්‍රවේණි .......................... ව පැවති අධ්‍යාපනය සාමාන්‍යකරණය කළේ ය.
   1) සාධකයක් ව  2) බාධකයක් ව  3) උරුමයක් ව  4) ව්‍යාපාරයක් ව

6. සාහිත්‍යකරුවාගේ වික්‍රමයන් ප්‍රකට වන්නේ බසෙහි ........................ මත ය.
   1) හසළත්වය  2) පරිපාලනත්වය  3) අද්විතීය  4) වේගය

7. අභිනවගුප්ත පඬිවරයා ....................... විග්‍රහකොට ඇත්තේ 'අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව' ලෙස ය.
   1) අත්දැකීම  2) ප්‍රතිභාව  3) සතතාභ්‍යාසය  4) කාව්‍යය

8. අකාරාදී පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.
   1) රත්නපුර, ගම්පහ, රුවන්වැල්ල, මාතර
   2) කළුතර, හෝමාගම, මහනුවර, මාතලේ
   3) කොළඹ, බණ්ඩාරවෙල, රත්නපුර, රුවන්වැල්ල
   4) කළුතර, මහනුවර, ගම්පහ, මාතලේ



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

9. සඤ්ඤක අක්ෂරයක් නොමැති පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   1) කඹය, අඬනවා, හොඬ, ලුහුබැඳීම  2) වළඳන, ලුහුඬු, දඟරය, සඳකිඳුරු
   3) ගඟුල, හොඳ, කුඹුර, විහඟ  4) පූරහන, පසිඳු, පිරුළු, වැජඹෙන

10. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.
   1) තෘෂ්ණාව, අධිෂ්ඨානය, ශ්‍රවණාගාර, නිෂ්ශබ්ද
   2) ලේකම්, පුස්තකාලය, ලේඛනය, විශිෂ්ට
   3) පිළිවෙල, පශ්චිම, සංශෝධන, සමස්ත
   4) ත්‍යාග ප්‍රධානය, සමස්තය, කිරුළ, භාෂාව

11. "රැහැයියා" යන පදයේ ඇතුළත් පිල්ලම් නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   1) පාපිල්ල, ඇදය, ඉස්පිල්ල, ඇලපිල්ල  2) ඇදය, පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල
   3) ඇදය, ඇදය, ඉස්පිල්ල, ඇලපිල්ල  4) පාපිල්ල, ඉස්පිල්ල, ඇදය, ඇලපිල්ල

12. මුලින් දක්වා ඇති අක්ෂර වර්ගයට අයත් අකුරක් නොයෙදුණු වචනය සහිත වරණය තෝරන්න.
   1) මහප්‍රාණ - සම්බන්ධ, ඖෂධ, සංඝ, සංස්ථාව
   2) නාසික්‍ය - සම්භාව්‍ය, වර්ණනාව, උත්සවය, වනය
   3) ඌෂ්ම - විශේෂ, අස්ථිර, සශ්‍රීක, සහභාගී
   4) අන්තඃස්ථ - වයරය, කලාපය, සොයනවා, අවශ්‍ය

13. උපසර්ග පදයක් ඇතුළත් නොවූ පද පේළිය තෝරන්න.
   1) පබඳ, සුහද, පරසිඳු, ප්‍රභේද
   2) නිසල, නිදුක්, නිර්වචන, නිර්මල
   3) අවශේෂ, අවතීර්ණ, අවමාන, අවධාරණ
   4) සුසිරිත්, සුමිහිරි, සුන්දර, සුජාත

14. පහත දැක්වෙන පදවල අදහස අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   **ආකස්මිකව, උවම්, චිරන්තන, උක්තින්**
   1) හේතුවක් නැති ව, කියමන්, නවීන, උපමා
   2) හේතුවක් නැති ව, උපමා, පෞරාණික, කියමන්
   3) හේතුවක් ඇති ව, කියමන්, පෞරාණික, උපමා
   4) හේතුවක් ඇති ව, කියමන්, අද්‍යතන, උපමා

- පහත දැක්වෙන 15, 16 යන ප්‍රශ්නවල මුලින් දැක්වෙන ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

15. 1) උත්තම පුරුෂ නාම - මම, ඔහු, අපි, මා
   2) අනුක්ත - ඔවුන්, ගංගාවන්, බීසවක, අප
   3) උපසර්ග - අතිකරු, ඉපැරණි, අනුගමන, ප්‍රබල
   4) නිපාත - මෙන්, බඳු, පටන්, සේ

16. 1) යුගල පද - යානවාහන, හරිහමන්, ලෙඩදුක්, නඩුහබ
   2) ක්‍රියාපද - යමි, සෙවුහ, තැබුවා ය, බලමු
   3) උක්ත පද - ඔවුහු, කොල්ලන්, හෙතම, ඈ
   4) මධ්‍යම පුරුෂ නාම - තෝ, නුඹ, ඔබ, තී

17. පහත සඳහන් වාක්‍යයේ පූර්ව ක්‍රියාවක් නොයෙදෙන වරණය තෝරන්න.
   1) මම පාසලට ගොස් ඉගෙනුම ලබමි.  2) අම්මා පැමිණෙත්ම අපි නිශ්ශබ්ද වීමු.
   3) ඔවුහු ගමන් මල්ල පසෙක තබා නිදාගත්හ.  4) නිමාලි අප දෙස බලා නිවසට ගියා ය.

18) මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   1) නෙළුම් - තඹර, පියුම්, සරෝජ, කමල
   2) ඇස් - නයන, ලෝචන, නේත්‍ර, අක්ෂි
   3) ස්ත්‍රී - මව්, ලලන, වනිතා, මාගම
   4) මිහිරි - මධුර, මාධූර්යය, කන්කලු, මියුරු


SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

19. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   1) මෘදු - සිනිඳු  2) අධම - උත්තම
   3) ප්‍රකෘති - විකෘති  4) සුදන - දූදන

- 20 සහ 21 ප්‍රශ්නවල මුලින් දී ඇති පදවල ප්‍රකෘතිය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

20. පදය, මිනිසා
   1) පද, මිනිස්සු  2) පදය, මිනිසා  3) පද, මිනිස්  4) පාද, මිනිස්

21. නවතී, බැලූහ
   1) නව, බැලූ  2) නව, බල  3) නැවූ, බල  4) නවං, බලා

- 22 සහ 23 ප්‍රශ්නවල යටින් ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

22. පුද්ගලයෙකු තුළ <u>කුලුණු ගුණය</u> පවතින්නේ නම් ඔහු ශ්‍රේෂ්ඨයෙකි.
   1) නොසැලෙන ගුණය  2) වීර ගුණය
   3) කරුණා ගුණය  4) අභීත බව

23. සම්භාව්‍ය සාහිත්‍ය කෘති <u>පරිශීලනය</u> මගින් ජීවිතාවබෝධය ලැබේ.
   1) හැදෑරීම  2) කියවීම  3) ප්‍රබන්ධය  4) අභ්‍යාසය

24. නිවැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
   1) ආඛ්‍යාතයක් රහිත ව සෑදෙන වාක්‍යවල කර්තෘ අනුක්ත වේ.
   2) ගෞරවාර්ථ ප්‍රත්‍යයක් යෙදෙන වාක්‍යවල ආඛ්‍යාතය ඒකවචන වේ.
   3) කර්තෘකාරක වාක්‍යවල කර්මය උක්ත වේ.
   4) "තෙමේ", "තොමෝ" යන පදවල බහුවචන රූපය "තුමූ" වේ.

- අංක 25 සහ 26 වාක්‍යවල දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

25. වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම.
   1) අතු කඩා මොර කන්නා සේ  2) උඩින් මිතුරු - යටින් කතුරු
   3) දී කිරට බළල්ලුත් සාක්කි ලූ  4) අලි මදිවට හරක්

26. අගයක් නොමැති වීම.
   1) දියකාවගේ පිටේ ලුණු හැංගුවා වගේ  2) කැලේට පායපු හඳ වගේ
   3) ආඩි හත්දෙනාගේ කැඳ හැළිය වගේ  4) වැල යන අතට මැස්ස ගහන්නා සේ

27. ඌව පළාතේ "අම්මණ්ඩි" යන පදයෙන් හැඳින්වෙන්නේ,
   1) අම්මා  2) තාත්තා  3) මාමා  4) නැන්දා

28.
   A මං තනන්නෝ - මහගම සේකර
   B සක්වා ලිහිණි - සිරි ගුණසිංහ
   C සුනේත්‍රා - ඩබ්ලියු. ඒ. සිල්වා
   D මීළඟ මීවිත - රුවන් බන්දුජීව

ඉහත A, B, C, D අතරින් නිවැරදි වන්නේ,
   1) A හා B  2) A, C, D  3) A, B, C  4) B, C, D

- අංක 29, 30, 31 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. 1) දෙවන පැතිස් රජු දැහැමි පාලකයෙක් වූහ.  2) මා එය කියවා නැත්තෙමි.
   3) ඇතැම් මිනිසුන් වංක වන්නේ ඇයි?  4) ඕ තොමෝ මව් බැලීමට ආහ.

30. 1) ඔවුන් ලේඛකයෝ ද?  2) සිසුහු නියමිත වේලාවට පන්තියෙහි ඇත.
   3) මම මහණදම් පිරිය යුතු ය.  4) සැකකරුවන් සියලුදෙනා නිදහස්.

31. 1) සභාවෙන් කෙනෙක් ඉවත් වෙයි.  2) ඔවුහු තුමූ සභාවට පැමිණියා ය.
   3) දරුවෝ පාරේ දකුණුපසින් යාම මැනවි.  4) නුඹලා අනාගත නායකයෝ.



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

32. පළිබෝධකයන් පළවා හැරීම සඳහා භාවිත කළ පරිසර හිතකාමී ක්‍රමයක් නොවන්නේ,

1) සේරංගාව සවි කිරීම
2) මරුවැල එළීම
3) කුරුලු පාළුව
4) සොකඩ බැඳීම

33. පහත දැක්වෙන කවියේ හතර වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

පෙරකල් ජාතියෙ පැතුවා වැන්නේ
පර මල් පිදුවා දෝ පල දුන්නේ
නර මුල් ඇඟ ඇට කිඹුලෙකු වැන්නේ
..........................................................

1) ලීල් නැතිව නිසරු ව තෙපලන්නේ
2) මහල්ල නුඹගේ හිමි ද අසන්නේ
3) හැම කල් මළ දා දෝ සැප වන්නේ
4) වාල් විඳින දුක මෙ නුඹ විඳින්නේ

34) "කොහොමද යුෂ්මතී කඳු ප්‍රාන්තයට ගියේ?" යන ප්‍රකාශය කරන ලද්දේ,

1) සයිමන්
2) අසඩක්
3) නටාලියා
4) ගෞෂා

35. "සිංහලයා ඉතා විනීත ය. ආගන්තුක සත්කාරයෙහි තත්පර ය." යන්න සඳහන් වන කෘතිය වන්නේ,

1) බාලරාමායණය
2) වේලාසන කොක්කු ඇවිත්
3) ලක්බිම වනසැරිය
4) එදා හෙළ දිව

36. "සීතාවක සඳ ලොවින් ගෙනා සඳකඩක් මෙන් රිදී පැහැයෙන් බබළන්නට විය." යන වාක්‍යයෙහි ඇතුළත් උපමාව වන්නේ,

1) රිදී පැහැය
2) සඳකඩක්
3) සඳ ලොව
4) සීතාවක

37. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

**මං එනකොට හැමෝ ම හිටියා.**

1) මම එන විට සැමදෙනාම සිටිති.
2) මා පැමිණෙන විටත් හැමෝම ගොස් ඇත.
3) මා පැමිණෙන විට සියල්ලෝ සිටියහ.
4) මම පැමිණි පසු සියලුදෙනා පිටත් විය.

38. විශේෂාංග ලිපියක ඇතුළත් නොවන්නේ,

1) සරල භාෂාව
2) හෘදයාංගම වූ ලේඛන ශෛලිය
3) ප්‍රස්තාර හා අධෝ ලිපි
4) සිත් ගන්නාසුලු ශීර්ෂ පාඨයක්

39. නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස ගෞරවාදරයට පාත්‍ර වූයේ,

1) ආචාර්ය ඊ. ඩබ්ලියු. අදිකාරම් මහතා
2) ආචාර්ය සී. ඩබ්ලියු. ඩබ්ලියු. කන්නන්ගර මහතා
3) ආචාර්ය ටී. බී. ජායා මහතා
4) එස්. ඩබ්ලියු. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

**නාට්‍යෝචිත අවස්ථා යනු ප්‍රේක්ෂකයාගේ කුතුහලය හා ආතතිය උපරිමයෙන් කුළුගැන්විය හැකි අවස්ථා ය.**

1) නාට්‍යයක උපරිමයෙන් ආතතිය හා කුතුහලය තිබේ.
2) නාට්‍යෝචිත අවස්ථාවක දී ප්‍රේක්ෂකයාගේ කුතුහලය ආතතියක් බවට පත් වේ.
3) ආතතිය හා කුතුහලය නාට්‍යයක තිබිය යුතු ය.
4) ප්‍රේක්ෂක සිතෙහි ආතතියත් කුතුහලයත් මනා ව ඉස්මතු කිරීම නාට්‍යෝචිත අවස්ථාවකට නිදසුනකි.

(ලකුණු 1 x 40 = 40යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
# வலயக் கல்வி காரியாலயம் - கொழும்பு
# Zonal Education Office - Colombo

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025
Second Term Test - 2025

සිංහල භාෂාව හා සාහිත්‍යය II | 10 ශ්‍රේණිය | කාලය පැය දෙකයි

නම........................................................................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.

01. අංක i සිට x තෙක් සියලු අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. උත්පත්ති ස්ථාන අනුව පහත දැක්වෙන වචන දෙකෙහි අක්ෂර වර්ග මොනවාදැයි ලියන්න.
අ) කහ ආ) රළ

ii. පහත දැක්වෙන නාම පදයන්හි ප්‍රකෘති වෙන් කොට ලියන්න.
අ) පාසල ආ) කන්දෙන්

iii. පහත සඳහන් පොදු වහරේ එන යෙදුම් සඳහා මොනරාගල ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.
අ) කුරුල්ලා ආ) ඉරිඟු

iv. පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ගය ලියන්න.
අ) ඉර බැසූ අඳුර වැටෙන ආකාරය මම බලා සිටියෙමි.
ආ) වැසි වැටෙත් ම පක්ෂීහු පියාඹා යති.

v. පහත දැක්වෙන පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය ලියන්න.
අ) අගල ආ) අහල

vi. පහත දැක්වෙන පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
අ) නිශ්චිත ආ) ආරක්ෂාව

vii. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරක වාක්‍ය බවට හරවන්න.
අ) විද්‍යාචක්‍රවර්තීහු බුත්සරණ රචනා කළෝ ය.
ආ) කවියා තම නිර්මාණ රසවත් කිරීම සඳහා උපමා භාවිත කරයි.

viii. පෙළ පොතෙහි ඇතුළත් පහත දැක්වෙන පද සඳහා අරුත් සපයන්න.
අ) විස්මයාවහ ආ) සබවස

ix. පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කොට ලියන්න.
අ) මහගම සේකර මහතා විශිෂ්ට ලේඛකයෙකු වෙයි.
ආ) ඕ තොමෝ තම නැගණියන් ආරක්ෂා කළහ.

x. පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.
අ) ලේසි - .................. ආ) අවි - ....................

(ලකුණු 2 x 10 = 20යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

අ) අවිධිමත් කසළ කළමනාකරණය ප්‍රබල සමාජ ප්‍රශ්නයක් බවට පත් ව ඇත. මෙරට එකතු වන අපද්‍රව්‍ය පමණක් නොව විදේශීය ව බැහැර කරන කසළ ද මෙරටට ගොඩබෑම වැනි ගැටලු ද අපට අසන්නට ලැබිණි. මෙම ක්‍රමයන්ට නිසි විසඳුමක් මෙන් ම නීතිමය කටයුතු ද සම්පාදනය කිරීම රටක් වශයෙන් කළ යුතු කාර්යයකි.

ආ) අධ්‍යාපන ජයග්‍රහණ ලබන ප්‍රමාණය සංඛ්‍යාත්මක ව වර්ධනය වන බවක් දක්නට ලැබේ. නමුත් විභාගය පමණක් සමත් වීම ජීවිතයට ප්‍රමාණවත් නැත. යහපත් ජීවන රටාවකට හුරු වීම, මනා පෞරුෂයක් ගොඩනහා ගැනීම ආදිය ජීවන තක්සලාවට අත්‍යවශ්‍ය සාධක වේ. එමගින් සමබර ජීවන රටාවකට හුරු වීමටත් අභියෝගයන් හමුවේ නොසැලී සිටීමටත් මංපෙත් විවර වෙයි.

ඉ) කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතයට අප රටේ ජනතාව යොමු කරන ලද්දේ මුදල් මත පදනම් වූ සමාජ ක්‍රමය විසිනි. එනමුත්, වසර දහස් ගණනක සිට අපේ මුතුන්මිත්තන් සාම්ප්‍රදායික ගොවිතැනේ දී භාවිත කළ විවිධ කෙම් ක්‍රම, ස්වාභාවික විධි, කාබනික පොහොර යෙදීම වැනි දෑ සරු අස්වැන්නකට බලපෑවේ ය. එම නිසා, වස විසෙන් තොර කාබනික වගා ක්‍රම සඳහා ගොවීන් දිරිමත් කිරීමටත්, ඒ සඳහා පොදු වෙළෙඳපොළක් සකසා දීමටත් පෙළගැසෙමු.

ඊ) උසස් ළමා ගීත කලාවක් අතීතයේ දී ශ්‍රී ලාංකික දරුවන්ට උරුම වී තිබිණි. කොළඹ යුගයේ බිහි වූ කවීහු හා ගීත රචකයෝ මේ සඳහා දායක වූහ. එම ගීත මඟින් චින්දන ශක්තිය හා චින්තන හැකියා පුළුල් වූ සමාජයක් බිහි විය. නූතන ළමා ගීත, සාහිත්‍ය රසයෙන් හීන බවක් දක්නට ලැබේ. එබැවින්, හරවත් ළමා ගීත සාහිත්‍යයක අවශ්‍යතාව ප්‍රබල සාධකයකි.

(ලකුණු 25යි)

03. පහත දැක්වෙන ඡේදය වචන 40 - 50ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන පිළිතුර අග ලියන්න.

ආදි මානවයා තම ජීවනෝපාය සලසා ගන්නා ලද්දේ වනාන්තර ආශ්‍රිත ව සතුන් දඩයම් කිරීමත්, අල වර්ග එකතු කිරීමත් මඟින් බව ඉතිහාසඥයෝ පවසති. පහසුවෙන් ජලය ලබා ගත හැකි ස්ථානවල පිහිටි ස්වාභාවික ගල්ලෙන්වල මෙවැනි ආදිකාලීන මිනිසුන් වාසය කළ අතර සතුන් දඩයම් කර ගැනීමටත් ඔවුන්ගේ මස් කපා කොටා ගැනීමටත් රළු ගල් මෙවලම් භාවිත කළ බව ලෝකයේ විවිධ ස්ථානවලින් හමු වූ පුරාවිද්‍යාත්මක සාධකවලින් හෙළි වේ. ආහාර සොයාගැනීම පිළිබඳ අවිනිශ්චිත ස්වභාවයක්, අනතුරුදායක තත්ත්වයත් නිසා පසු කාලයක දී වඩා පහසුවෙන් ආහාර සපයා ගත හැකි ක්‍රමයක් ගැන ඔවුන්ට අවබෝධ විය.

දඩයමේ දී හමු වූ ඇතැම් සතුන් හීලෑ කර ගැනීමටත්, ඔවුන් ඇතිදැඩි කිරීමටත් පසුකාලීන මිනිසා පුරුදු විය. හීලෑ කර ගත් සතුන් සමඟ තැනින් තැන යමින් ඔවුන්ගේ කිරි සහ මස් ආහාරයට ගනිමින් ගත කළ ජීවිතය “එඬේර යුගය” ලෙස සලකනු ලැබේ. කල් යත් ම මෙම ක්‍රමයෙහි ද ගැටලු අවබෝධ කර ගත් ඔවුන් ස්ථාවර වාසස්ථානයක පදිංචි වී සතුන් ඇති කරමින් ගොවිතැනෙහි යෙදීමට අදිටන් කර ගත් බව පෙනී යයි. කරුණු සොයාගෙන ඇති අන්දමට මේ සඳහා ප්‍රධාන ගංගාධාර 4ක් තෝරාගෙන ඇත. එනම්, යුප්‍රටීස්-ටයිග්‍රීස්, නයිල්, ඉන්දු සහ හොවැංහෝ යන ගංගාධාර යි.

(ලකුණු 10යි)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අප්‍රිකානු රටවල ආර්ථික සංවර්ධනය සඳහා ම කැප වුණු බැංකුවක් දක්නට ලැබේ. එය නමින්, "අප්‍රිකානු සංවර්ධන බැංකුව" යි. එය අප්‍රිකානු මහද්වීපයේ රටවල් සඳහා මූල්‍ය පහසුකම් සපයන ආයතනයක් වශයෙන් ක්‍රියා කරයි. රටවල් 33ක සහභාගීත්වයෙන් 1964 දී ආරම්භ කරන ලද මෙය, 1966 ජූලි මාසයේ සිට සිය බැංකු කටයුතු ආරම්භ කළේ ය. පසුකාලීන ව අප්‍රිකානු නොවන රටවල් කිහිපයක් ද බැංකුවට සම්බන්ධ වී කටයුතු කළේ ය. මේ අනුව, චීනයට සහ ආර්ජන්ටිනාවට ද මෙම සංගමයේ සාමාජිකත්වය ප්‍රදානය කරන ලදී. මෙසේ කරන ලද්දේ බැංකුවේ ප්‍රාග්ධනය තර කර ගැනීමට එය හේතුවක් වන බැවිනි. සෑම වසරක් පාසා ම නව ව්‍යාපෘති 70ක් පමණ ආරම්භ කිරීමට සමත් වන මෙම බැංකුව, මේ වන විට ව්‍යාපෘති 250ක් පමණ නිම කොට ඇති බවට වාර්තා වෙයි. තම රටවල සෞඛ්‍ය, අධ්‍යාපන හා වෙනත් පොදු සේවාවන් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම මේ තුළින් සිදු වන බව ප්‍රතිලාභීන්ගේ අදහස යි.

1) අප්‍රිකානු සංවර්ධන බැංකුව ක්‍රියාත්මක වන්නේ කුමන අරමුණකින් ද?

2) මෙම බැංකුව තම බැංකු කටයුතු ආරම්භ කළේ කුමන කාල වකවානුවක ද?

3) අප්‍රිකානු නොවන රටවලට මෙහි සාමාජිකත්වය ප්‍රදානය කළේ කවර අරමුණකින් ද?

4) මේ වන විට එම බැංකුව විසින් නිම කොට ඇති ව්‍යාපෘති ගණන කොපමණ ද?

5) මෙම බැංකුව සම්බන්ධයෙන් ප්‍රතිලාභීන් විසින් දරන මතය කුමක් ද?

(ලකුණු 2 x 5 = 10යි)

05. ඔබ පාසලේ දරුවන් විසින් සංවිධානය කර මෙහෙයවනු ලබන "ජන කවි මඩුවක්" ඉතා උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කොට ඇත. ඒ සඳහා සහභාගී වන ලෙස දන්වමින් දෙමව්පියන්ට යවන ආරාධනා පත්‍රය පිළියෙළ කරන්න. ඔබ, සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.

නැතහොත්

සඳමිත්පුර ප්‍රදේශයේ තරුණ සංගමය මගින් ප්‍රදේශය තුළ ම දක්නට ලැබෙන ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා ගනිමින් විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කර ගත් පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අදහස් කරයි. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් උපදේශකවරයෙකු ලබා ගැනීමේ අවශ්‍යතාව පවතියි. මේ බව දන්වමින් ප්‍රාදේශීය ලේකම්වරයාට යැවෙන ලිපිය සකස් කරන්න. ඔබ, තරුණ සංගමයේ ලේකම්, සම්පත් රණවීර යැයි සිතන්න.

(ලකුණු 15යි)

SLGURU.LK

Education Purpose Only

SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
# வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்தனபுரம்
# Zonal Education Office Colombo - Sri Jayawardhanapura

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025
Second Term Test - 2025

**සිංහල භාෂාව හා සාහිත්‍යය III** | **10 ශ්‍රේණිය** | **කාලය පැය දෙකයි**

නම........................................................................

- දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 යන ප්‍රශ්නවලටත් 5, 6, 7 යන ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80කි.

01. අංක i සිට x තෙක් සියලු අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. ආ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ ලියන්න.
ආ) සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතිය ලියන්න.

ii.
තත මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
..........................................

අ) මෙම කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
ආ) මෙහි "පිළිමල්" ලෙස හැඳින්වෙන්නාගේ නම ලියන්න.

iii. අ) බැද්දේගම නවකතාවේ එන සිළිඳුගේ සොහොයුරියගේ නම ලියන්න.
ආ) එම කෘතිය සිංහලයට පරිවර්තනය කළ රචකයා කවුරුන් ද?

iv. "වෛදේහ රාජ්‍යය ගෙන කුමක් කරමෝ ද? ඒ රජ්ජුරුවෝත් අප නතුවෝ ම ය."
අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් විසින් ද?
ආ) මෙසේ පවසන්නේ කා හට ද?

v. අ) විවේකය දැනුවත්කමින් ගත කිරීම සඳහා යොදා ගත් ජනකවි විශේෂය කුමක් ද?
ආ) "හානා හීය පානා අඩහැරෙන් දැනේ" යන ජනකවිය කවර ජනකවි ගණයට අයත් ද?

vi. "මම බොහොම කරදර විඳගෙන ආවෙ එයා සොයන්න. එයා මේක ඇතුළෙ ඇති."
අ) මෙහි "එයා" යනුවෙන් හැඳින්වෙන්නාගේ නම ලියන්න.
ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කරන්නා කවුරුන් ද?

vii.
ගසට කෙටුම ගස මුල පැයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
..........................................................
හානා හීය පානා අඩහැරෙන් දැනේ

අ) මෙම කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
ආ) "අඩහැරය" යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

viii. "ඉඳින් නුඹවන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව."
අ) මෙහි "නුඹවහන්සේ" යනුවෙන් හැඳින්වෙන්නාගේ නම ලියන්න.
ආ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?


SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

ix. අ) ගුත්තිල කාව්‍යය නිර්මාණය වූයේ කවර ජාතක කතාවක් ඇසුරින් ද?
ආ) එම කාව්‍යය රචනා කරන ලෙසට ආරාධනා කළ තැනැත්තාගේ නම ලියන්න.

x. "ඔව්, එයත් මෙහෙ හිටියා. උඹ ළඟ සල්ලි හෙම තියෙනවද ගැනියේ?"
අ) මෙහි "එයත්" යනුවෙන් හැඳින්වෙන්නාගේ නම ලියන්න.
ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තාගේ නම ලියන්න.

(ලකුණු 2 x 10 = 20යි)

02. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
පුර'ඹර වසමින් සිටි රහ කුම් වැනි
සුර සෙනඟට සුර'සුන් පැනවූ වැනි

අ) ඉහත පද්‍යයට අනුව කුරුල්ලන්ගේ පියාපත් විහිදාලීම උපමා කරන්නේ කුමකටදැයි ඔබේ වචනයෙන් ලියන්න.
ආ) කුරුල්ලන්ගේ මෙම හැසිරීමට හේතු වූ කාරණය කුමක් ද?

ii. "ජඩය, මැත නොදොඩා තොයිත් තාගේ පණ නො නසා යන අතෙක නැඟී යා..."
අ) මෙසේ පවසන්නේ කවුරුන් ද? කා හට ද?
ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

iii) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඩු ගිනි තපින්ට ද
වෙර නැති දා ගහ ගත්තේ දිනන්ට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

අ) "වෙර" සහ "කග" යන පදයන්හි අර්ථ ලියන්න.
ආ) මෙම පද්‍යය හා සම්බන්ධ ව පවතින පිරුළ ලියන්න.

iv. "ඔව්, මං හිතනවා මිනිහා මැරිලයි කියලා. හිර ගෙදරට යන මිනිස්සු උන් හිටි හැටියේ ම මැරෙනවා..."
අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් ද? කා හට ද?
ආ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කාරණය කුමක් ද?

v. අසන රිසින් නයි කැල ඔසළෝයා
ඔවුන් වෙත ම සිටිනා ගුරුළෝයා
වයන එ වෙණ නද ලොබ ම කළෝයා
එදින වයිර සිත සිහි නොකළෝයා

අ) මෙම පද්‍ය පන්තියේ සඳහන් වෛරී සත්ත්ව කොට්ඨාසයෝ කවරෙහු ද?
ආ) එදින වෛර හැඟීම් නැති වීමට හේතු වූ කාරණය කුමක් ද?

(ලකුණු 2 x 10 = 20යි)

SLGURU.LK

Education Purpose Only

SLGURU.LK

03. මහෞෂධ පඬිතුමාගේ,

අ) උපාය කෞශල්‍යයත්

ආ) දුර දක්නා නුවණත්

හේතුවෙන් වෛදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

ගුත්තිල කාව්‍යය රසවත් ව රචනා කිරීම සඳහා

අ) වර්තමාන සරල වහර ද

ආ) කාව්‍යමය වියත් වහර ද

යොදාගෙන ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

04. යහපත් ජීවිතයකට අවශ්‍ය උපදෙස් ලබා දීමේ දී,

අ) මනා සංයමයත්

ආ) නිදර්ශන ඉදිරිපත් කිරීමත්

ජනකවියා සතු කුසලතාවකි. "හානා හීය පානා අඬහැරෙන් දැනේ" පද්‍ය පන්තිය ඇසුරින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

පාඨක සිත දයානුකම්පාවෙන් පුරවාලීමට බැද්දේගම කතුවරයා උත්සාහ දරා ඇත්තේ,

අ) මනා චරිත නිරූපණයත්

ආ) අවස්ථා හා සිද්ධි නිරූපණයත්

මගිනි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

5, 6, 7 යන ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලියන්න.

5. "අවුරුදු දහයකින් මුළු ගම ම අලින්ට යනවා" යි නැන්චො හාමි කී අනාවැකිය සත්‍යයක් වූ ආකාරය නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න.

6. ජන කවියා තම නිර්මාණය රසවත් කිරීමෙහි ලා කාව්‍යාලංකාර යොදාගෙන ඇති ආකාරය "හානා හීය පානා අඬහැරෙන් දැනේ" පද්‍ය පන්තිය ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

7. තමාට තමා අමතක වන තරමට ම වීණා නාදය මිහිරි බව පැවසීමට ගුත්තිල කාව්‍ය කතුවරයා කාව්‍ය සංකල්පනා යොදා ගත් ආකාරය උදාහරණ තුනක්වත් දක්වමින් පහදන්න.

(ලකුණු 10 යි)



SLGURU.LK
Education Purpose Only